# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
## காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
## LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.


| මගේ අංකය / எனது இல / MY NO | 4/10/චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / YOUR NO | | දිනය / திகதி / DATE | 2013.11. 26 |
|---|---|---|---|---|---|

චක්‍රලේඛ අංක :- 2013 / 07

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**ඉඩම් රාජකාරි විධිමත් කිරීම.**

උක්ත කරුණට අදාලව මාගේ අංක 2012/02 දරන 2012.06.06 දිනැති චක්‍රලේඛ හා අංක 2012/02(1) දරන 2012.08.07 දිනැති චක්‍රලේඛය කෙරෙහි කාරුණික අවධානය යොමු කරවමි.

02. රජයේ ඉඩම් ආඥා පනත යටතේ ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගේ අනුමැතිය මත අනුග්‍රාහික පදනම මත දීර්ඝ කාලීන බදු ක්‍රමයට හෝ නිදහස් දීමනා පත්‍රයක් මත ඉඩම් ලබා දීම සඳහා නිර්දේශ සකස් කර එවීමේදී ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන බව කාරුණිකව සලකන්න. ඉඩම් කච්චේරි පවත්වා එකවර වැඩි පිරිසකට ඉඩම් ලබා දෙන අවස්ථා වලදී පමණක් එවැනි අනුමැතියක් ලබා ගැනීම ප්‍රමාණවත් වේ.

03. අනුග්‍රාහික පදනම මත ඉඩම් ලබා දෙනු ලබන්නේ විශේෂ හා ප්‍රමුඛ අවශ්‍යතාවයන් සඳහා බැවින් මෙවැනි ඉල්ලීම් ගරු අමාත්‍යතුමාගේ යොමු කිරීමක් සහිතව ඉදිරිපත් වන අවස්ථාවලදී සහ අමාත්‍ය මණ්ඩලයේ තීරණ මත හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය මත හෝ වෙනත් රජයේ අනුග්‍රහය ලබන විශේෂ ආයෝජන ව්‍යාපෘතියක් ලෙස ඉදිරිපත් වන අවස්ථාවලදී ඉහලම ප්‍රමුඛතාවය ලබා දෙමින් ඔබේ නිර්දේශ වාර්තා ඉතා ඉක්මනින් සකස් කර එවිය යුතු බව අවධාරණය කරමි.

ආර්.පී.ආර්.රාජපක්ෂ,
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :-

01. ලේකම් , ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.
02. පුද්ගලික ලේකම් , ඉඩම් හා ඉඩම් සංවර්ධාන අමාත්‍යතුමා.
03. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්.
04. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු.
05. නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස්වරු ( අන්තර් පළාත් )


දුරකථනය / தொலைபேசி / Telephone: 011-2797400
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2864051
වෙබ් ලිපිනය / இணையம் / Web Address: www.landcommdept.gov.lk
ඊමේල් / ஈ-மெயில் / E-mail: landcom@landcommdept.gov.lk